# ප්‍රචණ්ඩා ඉල්ලා අස්වෙයි. අලුත් ආණ්ඩුවක් සෑදෙයි.

මැයි 23 වැනිදා නව අගමැතිවරයෙක් පත්වී නේපාලයේ රාජකාරී භාර ගත්තේය. මැයි 04 වෙනිදා අගමැති ධූරයෙන් ඉල්ලා අස්වූ නේපාලයේ එක්සත් කොමියුනිස්ට් පක්ෂයේ (මාඕවාදී) සභාපති වූ අගමැති ප්‍රචණ්ඩාගේ ආණ්ඩුව වෙනුවට දේශපාලන පක්ෂ 24 න් 21 ක සහයෝගය ඇතිව ආණ්ඩුවක් පිහිටුවමින් නේපාලයේ කොමියුනිස්ට් පක්ෂයේ (එක්සත් මාක්ස් ලෙනින්වාදී පක්ෂය) චාදේව් කුමාර් අගමැති ධූරය භාර ගත්තේය. ප්‍රචණ්ඩා, නේපාලයේ හමුදා ප්‍රධානියා වූ කටාවාල් ඉවත් කිරීමත්, කටාවාල් ඉවත් කිරීම ප්‍රතික්ෂේප කිරීමත් වටා ඒකරාශී වුණු නේපාලයේ ව්‍යවස්ථා අර්බුදය මධ්‍යයේ ආණ්ඩුවේ මෙම වෙනස්වීම සිදු විය.

දස අවුරුද්දක් පැරැණි මහජන යුද්ධය අවසාන කරන්ට 2006 දි ගෙනා සහයෝගතා සාම එකඟතාව සහ තාවකාලික ව්‍යවස්ථාව නොසලකා හරිමින් සිවිල් ආණ්ඩුවට නොනවත්වා හිතාමතා ප්‍රකෝප කරවන අකීකරුකම නිසා අගමැති ප්‍රචණ්ඩා විසින් හමුදා ප්‍රධානියාවූ කටාවාල් නෙරපා දැමුණි. නමුත් නේපාල කොංග්‍රස් පක්ෂය සමග ඉතා මිත්‍ර ජනාධිපති රාම් බරාම් යාදව් ප්‍රචණ්ඩාගේ තීරණය ප්‍රතික්ෂේප කර හමුදා මණ්ඩලයේ ප්‍රධානියා වශයෙන් පහ කිරීම පිළිගැනීමට කටාවාල්ගේ ප්‍රතික්ෂේප කිරීම පිටුපස සිටියේය. අනිත් දේශපාලන පක්ෂ විශේෂයෙන් ප්‍රචණ්ඩා විසින් මෙහෙයවනු ලැබූ ආණ්ඩුවේ සහයෝග කොටස්කරුවන් වශයෙන් සේවය කළ එක්සත් මාක්ස් ලෙනින්වාදී පක්ෂය හමුදා ප්‍රධානී කටාවාල්ගේ පැත්ත ගැනීමත් පක්ෂ ගැටීමත් සිදුවිය. ආණ්ඩුව තුළ සහභාගිත්වය පිටුපස නොතිබුණු කටාවාල් පහකිරීමට තීරණය යටින් බිඳින විශාල බලයක් තිබුණු ඉන්දියානු පක්ෂය පිටුපස සිටි නේපාල කොංග්‍රස් පක්ෂය ප්‍රචණ්ඩා පිට වරද පටවා තිබුණි. මේ සංවර්ධනයන්ට මුහුණ දෙමින් ප්‍රචණ්ඩා අගමැති ධූරයෙන් ඉල්ලා අස් විය.

වත්මන් ව්‍යවස්ථාවේ නියමයන් පැහැදිලිව කඩකිරීමත් ජෙනරල් කටාවාල් අගමැති ප්‍රචණ්ඩා විසින් අස් කිරීමට අනුබල දීමට අනිකුත් පක්ෂ සහ නේපාල ජනාධිපති යාදව් අසමත්වීම මෙම අර්බුදය කඩා වැටීමේ විශේෂ සිද්ධියක් විය. නේපාලය පාලනය කරන්ට නීත්‍යානුකූල අයිතිය තිබෙන්නේ කවුරුන්ටද?, සම්පූර්ණ තත්ත්වය බලපාන ප්‍රශ්නයයි. පැරැණි රාජ්‍යයේ බලවේග සහ එය නියෝජනය කරන පංති බලවේගයන් ඉවත් කරන්ට වෙනත් රාජ්‍ය බලයක් සමග ක්‍රමයේ අලුත් වර්ගයක මාවතක් විවෘතකර බලසම්පන්න විප්ලවීය මහජන යුද්ධයක් දියත් කළ බලවේගවලට මේ මොහොතේ තීරණාත්මක ප්‍රශ්නය එයයි.

නේපාල කොමියුනිස්ට් පක්ෂය (මාඕවාදී) ව්‍යවස්ථාදායක සභාවේ විශාලතම ආසන සංඛ්‍යාව සහ 2008 අප්‍රේල් මැතිවරණයේ ජයග්‍රාහකයා වශයෙන් පළල්ව හඳුනා ගෙන තිබියදීත්, නේපාලයේ ඇතුලත සහ පිටත ප්‍රතිගාමී අධිරාජ්‍යගැති බලවේගයෝ ඔවුන්ගේ ආණ්ඩුවේ, මූලිකත්වයට නීත්‍යානුකූල බල වශයෙන් මාඕවාදීන්ව කල්පනා කර නොතිබුණි. අවුරුදු ගණනාවක්ම මහජන විමුක්ති හමුදාව සහ නේපාල කොමියුනිස්ට් පක්ෂය (මාඕවාදි) නායකත්වය දුන් විප්ලවීය අරගලය මැඩ පවත්වන්නටත් මහජන යුද්ධය පැවතුණු සම්පූර්ණ කාලසීමාවේදී රාජාණ්ඩුව සමග එකතුව වැඩ කළ සීමාවේදී රාජාණ්ඩුව සමග එක්ව වැඩකර ප්‍රතිගාමී රජයේ ආරක්ෂකයෝ වශයෙන් මෙම දේශපාලන පක්ෂ රාජාණ්ඩුව යටතේ ආණ්ඩුවට සේවය කර තිබුණි. අවසාන වශයෙන් රාජාණ්ඩුවේ පාලනය අවසන් කරන්ට බොහෝ පළල් ස්තර එකතුවී පැරැණි පාලක බලවේගයන්ට පැරැණි ආකාරයෙන් තවදුරටත් නේපාල පාලනය ගෙන යෑමට නොහැකි තත්ත්වයට අරගලය නැගුණු විට මෙම දේශපාලන පක්ෂවලින් සමහරක් රාජාණ්ඩුව වෙනුවට සමූහාණ්ඩුවකට ඇතුලත්වී ජනප්‍රිය නැගීසිටීම තුළ එකතු විය. පාලනය කරන්ට සහ විනාශකර දමන්ට බැරි බලවේගය වශයෙන් මහජන හමුදාවේ සටන්කරුවෝ සහ කොමියුනිස්ට් පක්ෂයට පින්තූර අඳින්ට උත්සාහ කරමින් සිටි අතරම වෙනස් සහ ප්‍රගතිශීලී ව්‍යවස්ථානුකූල බලවේග වශයෙන් ඔවුනොවුන්ව හඳුන්වා දෙන්ට එක්සත් මාක්ස් ලෙනින්වාදි පක්ෂය  උත්සාහ කර තිබුණි.

මැතිවරණ ප්‍රතිඵලය නිකුත්වූදා සහ අගමැති වශයෙන් ප්‍රචණ්ඩා නායකත්වයෙන් වූ අලුත් ආණ්ඩුව තුල හමුදා දෙක සමග කටයුතු කිරීමත් නේපාල හමුදාවේ පාලනය කවුරුන්ද යන්නත් ගැටුම වී තිබුණි. (රාජකීය නේපාල හමුදාව සහ මහජන විමුක්ති හමුදාව) (දැන් එය නේපාල හමුදාව ලෙස නම් කෙරේ) මහජන යුද්ධයේ සම්පූර්ණ කාල පරිච්ඡේදය අතරවූ යුද්ධය මෙම හමුදා නතරවී තිබුණි. නේපාල බහුජනතාව මහජන විමුක්ති හමුදාව විමුක්තිය සඳහා බලවේගයක් වශයෙන් දැක තිබුණු අතර නේපාල රාජකීය හමුදාව ජනතාව කෲර ලෙස මර්ධනය කිරීම සඳහා ප්‍රසිද්ධියට පත්වී තිබුණි. නේපාලයේ අලුත් රජයේ ප්‍රධානත්වය ව්‍යවස්ථානුකූලවූ හමුදාව කොයිකද? පැහැදිලිවම මහජන විමුක්ති හමුදාවට විප්ලවීය උවමනාව වෙනුවෙන් එහි බලවේග නායකත්වය දී තිබුණි. නේපාල හමුදාව එසේ නොවේ. මෙම හමුදා දෙක සහයෝගිතා සාම ගිවිසුමට අනුව එක් නේපාල හමුදාවක් බවට සම්පූර්ණවනසේ එක් කරන්නේ කොහොමද? සිවිල් ආණ්ඩුවේ අධිකාරයට පිලිතුරු නොතිබුණි. නේපාල රාජකීය හමුදාව එහි මූලික ස්වභාවයේ වෙනසක් නොකර එහි නව නේපාල හමුදාව ලෙසට වෙනස් කළ අතර මහජන විමුක්ති හමුදාවේ බලවේග කඳවුරුවලට සීමා කිරීම ඇත්තටම අදහස් කළ දෙයයි.

මේ සම්පූර්ණ කිරීම සිදුවන අතරතුර ආණ්ඩුව සෑදූ විවිධ දේශපාලන පක්ෂ විසින් නියෝජනය කළ නේපාලය තුල විවිධ පංති බලවේග අතර ගැටුම වඩාත් සිද්ධ වෙමින් තිබුණි. ''ජාත්‍යන්තර ප්‍රජාව'' බ්‍රිතාන්‍යය, ඉන්දියාව සහ එක්සත් ජනපදය මෙන්ම අනිකුත් ප්‍රධාන බලවේග කළහ කාරිව ඔවුනොවුන්ම ඇතුල්වී තිබුණු ක්‍රියාමාර්ගය තුලට ගෙන ඒමට ව්‍යවස්ථානුකූල නොවූ බලවේගයක් වශයෙන් මහජන විමුක්ති හමුදාව බැහැර කරමින් නේපාල කොමියුනිස්ට් පක්ෂයට (මාඕවාදී) රාජ්‍ය පාලනය කරන්ට උවමනා බවට කෑමොර ගැනීම ඉහල දමමින් නේපාල කොමියුනිස්ට් පක්ෂයේ (මාඕවාදී) ක්‍රියාමාර්ගයට විරුද්ධව පීඩනය සෘජුවම ඇතිකරමින් ඔවුන් දන්නා ඔවුන්ගේ විවිධ මාර්ගයන් දියත් කර තිබුණි. කටාවාල්ව අස්කිරීමේ අර්බුදය මධ්‍යයේ සාකච්ඡාවන්ගේත් සෑහීමකට පත්නොවූ අතර විවිධ රටවලින් නියෝජිතයෝ ප්‍රචණ්ඩා හමුවිය. ඔහු ඉන්දියාවෙන් සහ අනිකුත් රටවලින් කටාවාල්ගේ පහකිරීම මත ඔහුට පසුබිමින් බලපෑම සහ ඉලක්කයන්ගේ තිබුණු පීඩනය බව අගමැති වශයෙන් ඔහු ඉල්ලා අස්වන විට ප්‍රචණ්ඩා විසින් නිකුත් කරනලද ප්‍රකාශනයෙන් පැහැදිලිය. මේ බලවේගයන්ගේ මෙම අවස්ථාවේ බේරුම් කිරීමට අස්කරමින් තිබුණු ව්‍යවස්ථානුකූල ක්‍රියාමාර්ගය කුමක්ද? නුඹම අසන්න?

ඔවුන්ගේ බලාපොරොත්තුව ඉටුකරන්ට මේ මෑත අර්බුදය මධ්‍යයේ හරියටම නේපාල කොමියුනිස්ට් පක්ෂය (මාඕවාදී) ත්‍රස්තවාදී සංවිධානවල නිල ලැයිස්තුවට නැවත ඇතුල් කරන බවට එක්සත් ජනපදයේ රාජ්‍ය දෙපාර්තමේන්තුව තීරණය කළේය. විප්ලවයේ බලවේගයන්ට විරුද්ධව නේපාල හමුදාව ගනු ලබන ඕනෑම ක්‍රියාවන් යුක්ති සහගත කරන්ටත් විප්ලවය සහ මහජන හමුදාව සුණු විසුණු කරන්ටත් වැඩකරමින් සිටිමේ බලවේගයන් පසුපසින් දීමට අදහස් කළේ මෙයයි.

පැහැදිලි කාරණය නේපාල කොමියුනිස්ට් පක්ෂය, එක්සත් මාක්ස් ලෙනින්වාදී පක්ෂය සහ ආණ්ඩුවට අවනතවීම රදළවාදී අධිරාජ්‍යවාදී නියෝජිතයාවන කටාවාල් ඔහුගේ ප්‍රතික්ෂේප කිරීම පිළිගත් එක්සත් මාක්ස් ලෙනින්වාදී පක්ෂය නායකත්වය දෙන ආණ්ඩුවෙට සහයෝගය දෙමින් සිටින අනිකුත් පක්ෂ නේපාලය පුරා පාලනය කරමින් තිබෙන රාජ්‍යයේ පවතින ව්‍යුහයේ මූලික වෙනසක් සිදුකරන්ට ඉඩදීමට අදහසක් නැතිබව මෙම බලවේග හෙළිදරවු කරයි. ඔවුන්ගේම ව්‍යවස්ථාව සහ නීතීන් නවතයිද? නේපාල බහුජනතාව සටන් කළ සෑම දෙයකටම එරෙහිව ඔවුන් අලුතින් ආණ්ඩුවක් පිහිටුවා ඇත. නේපාල හමුදාව මහජන විමුක්ති හමුදාව සම්පූර්ණයෙන් එකතු කිරීමවූ සහයෝගිතා සාම ගිවිසුමේ වූ පොරොන්දුවට විරෝධය ඔවුන්ගේ අභිප්‍රාය බව අන්තිමේදී පැහැදිලිව පෙන්වයි. මහජන විමුක්ති හමුදාවේ සටන්කරුවන්වත් සම්පූර්ණ වනසේ නේපාල හමුදාවට එකතු කිරීම ඔවුන් රුස්සන්නේ නැතිනම් මහජන විමුක්ති හමුදාව සඳහා ඔවුන්ගේ වැඩ පිළිවෙල කුමක්ද? බහුජනතාවගේ පීඩාව වෙනුවෙන් සටන් කළ මහජන විමුක්ති හමුදාව සම්පූර්ණයෙන්ම කැඩී බිඳී යාම පමණක් එයට උවමනාය. මෙහි සහමුලින්ම නොපිළිගතහැකි ප්‍රතිඵලය විප්ලවය ඉදිරියට ගෙනයාමට හැකියාව නැතිව විප්ලවයේ ධාන්‍ය ආරක්ෂා කරන්නට බලය නැතිව ජනතාව ඉවත්වීමට පටන් ගැනීමයි.

ප්‍රචණ්ඩා අගමැති වශයෙන් ඉල්ලා අස්වීමේ සිට මෙම අර්බුදය නිර්මාණය කළ අනිත් පක්ෂ සහ එක්සත් මාක්ස් ලෙනින්වාදී පක්ෂය නායකත්වය දෙන ආණ්ඩුවට එකතුවීම එක්සත් නේපාල කොමියුනිස්ට් පක්ෂය මාඕවාදී ප්‍රතික්ෂේප කර ඇත. ඔවුන් ව්‍යවස්ථාව සභාව පවත්වා නැත. නමුත් ජෙනරාල් කටාවාල්ම ඔහුගේ නිලයේ දිගටම කටයුතු කිරීමට ඉඩදීමට ජනාධිපති යාදෙව් ගත් තීරණය අවලංගු කරන ලෙසට බලකර ඇත. ඒ සමගම කත්මණ්ඩු වීදිවල එක්සත් නේපාල කොමියුනිස්ට් පක්ෂයට (මාඕවාදී) සහයෝගය දීමේ, බහුජනතාව එක්රුස් කර ඇත. නව ප්‍රජාතන්ත්‍රවාදී ඉලක්ක ඉදිරියට ගෙනයෑම මත ඉල්ලීම් සකස් කරන්නේනම් සත්‍ය වශයෙන් කොපමණ කල් ඉදිරියට යාවිද? අපැහැදිලිය. මෑත අර්බුදයේ සියලුම සිද්ධීන් එක් පැත්තකින් අලුත් සමාජවාදී සමාජ ක්‍රමය සහ සම්පූර්ණයෙන් වෙනස් රාජ්‍යයක් සඳහා අරගලය ඉදිරියට ගෙනයාම අවශ්‍යතාවය ඇතුලත්වූ ජනතාවගේ කටයුතු සහ අනික් පැත්තෙන් කිසිම මූලික ආකාරයකින් වෙනස් කරමින් දේවල් තබාගන්ට අධිෂ්ඨාන කර සිටින පැරැණි නීතියේ බලවේග අතර මූලික වෛරය එලිදරවු කරන්ට පමණක් සේවය කර ඇත.

තත්ත්වය ඉතා චංචලව පවතී. විප්ලවය අනතුරේය. නමුත් පොදුජනතාවගේ බෙල්ල මිරිකා දැමීමට නායකත්වය දෙන්ට පදනමක් සපයමින් ඔවුහු උගුල අටවා ඇත. ඔවුහු අලුතින් පත් කරගත් ආණ්ඩුවට සම්බන්ධවූ පැරැණි ක්‍රමයේ බලවේගයන් එක්සත් නේපාල කොමියුනිස්ට් පක්ෂයේ (මාඕවාදී) සහභාගිත්වය නැතිව, ජනතාව නීත්‍යානුකූල වශයෙන් නොපිළිගනීවි. ජාත්‍යන්තර අර්බුද කණ්ඩායමේ අධ්‍යයන (සහ ආර්ථික වගේ ධනේශ්වර ප්‍රකාශිත බුසල්වල පදනම ඇති අධිරාජ්‍යවාදී නියෝජිතයන්) මෙම අර්බුදය නේපාලයෙන් පිටත බලවේගයන් බවත්, විශේෂයෙන් ඉන්දියාව මෙම අර්බුදය වංචා කරමින් අශෝභනව සිටින බවත්, කනස්සලු වන බවත් හඟවයි. අලුතින් පිහිටුවාගත් ආණ්ඩුව සමග බහුජනතා අප්‍රසාදයට මෙම සියලුම බලවේගයෝ බියවෙති. ඔවුහු සටන් කළ පරිත්‍යාග කළ විප්ලවීය පරිවර්තනයන් ඉදිරියට ගෙනයාම සඳහා ජනතාවගේ ආවේගයට බිය වෙති. නමුත් එය පැහැදිලිය. අධිරාජ්‍යවාදීන් සහ පැරැණි ක්‍රමයේ බලවේගයෝ කරන කුමක් හෝ ඔවුන් පංති අවශ්‍යතාවයන් ඉදිරියට ගෙනයාම සහ ඔවුන් ක්‍රියා කරාවි. එසේ ඒවා දිගටම යාවි.

පැරැණි ක්‍රමයේ බලය වැඩි කරන වත්මන් ධනේශ්වර ව්‍යවස්ථාමය රාමුවෙන් සීමා නොවී විප්ලවීය පදනමක් මත මේ අර්බුදය විසඳාගන්ට වැඩ කරන්ට සහ මේ මොහොතේ බලය අල්ලා ගන්ට නායකත්වය අවශ්‍යය. අපේ ලිපියෙන් කියා ඇති පරිදි නේපාලයේ සංවර්ධනය මත කොමියුනිස්ට් ව්‍යාපාරය බලපායි.

අවසානයේ කොමියුනිස්ට් ඉලක්කය ඇතිව සමාජවාදය අපට පළමු පියවර වශයෙන් නව ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය සම්පූර්ණ කරන්ට අරගලය - ප්‍රතිසංස්කරණවාදී ව්‍යාපාර, ක්‍රමානුකූලව මායාව දියුණු කර සහතික කර කීම මත උත්සාහ කිරීම නොව විප්ලවීය අදහස් උවදු - නේපාලය ඉදිරියට ගෙන යාමට අදහස් කරන කොමියුනිස්ට්වාදයේ අරමුණු මූලික ප්‍රතිපත්ති නැවත සහතික කර ප්‍රකාශ කිරීමක් ඉහත සියල්ල අදහස් කරයි.

පරිවර්තනය<br>
නව මාක්ස්වාදී අධ්‍යයන කණ්ඩායම<br>
අංක 03

http:/ / slmarxist.yolasite.com
slmarxist@ymail.com